වරුපය ද තරමක් දුරට රැකගනිමින් රචනා කොට ඇති ආකාරය අපූරු බවකින් යුක්ත වෙයි.

කථාන්තරයක් කවියෙන් කියා පාන ස්වරූපය ද රැකගනිමින් කතුවරයා එකිනෙක සිද්ධීන් අනුපිළිවෙළින් ගෙන කවියට නගා ඇත.

"වේදේහ තිරිඳා
දැක ඒ සිහින බියදා
සැක මුසුව නොනිදා
රැය පහන්කර නැගී පසුදා"
(33 පිට, 16 පද්‍යය)

සරල වූ ද, රසවත් මෙන්ම කාව්‍යමය ගුණයෙන් යුක්ත වූ ද බස් වහර තිසා පාඨකයාට මෙය සතුටින් කියවාගෙන යා හැකි තත්වයක් පෙන්නුම් කරයි. පොදුවේ ගත් විට මෙහි භාෂාව යොදාගත් ආකාරයෙහි ලිහිල් බව ඇතත් ඇතැම් යෙදුම් විශේෂ අරුතකින් යොදාගන්නට සිදුවන තැන්හිදී පාදක සටහන් මගින් ඒවායේ අරුත් පහදා දීමට දර්ශන රත්නායක කවියා යොමු වී තිබීම ද වැදගත් කරුණකි. නිදසුන් ලෙස දැක්වතොත්, "දැක ඒ සිහින බිය දා" යන පදයෙහි 'බිය දා' යන යෙදුමෙහි අරුත පිළිබඳව පාඨක මනස තුළ කුතුසක් ඇති වීමට ඉඩ ඇත. එවැනි තත්වයක් මගහරවා ගනිමින්, 'බිය දා - බිය උපදවන' යනුවෙන් අරුත පැහැදිලි කර දී ඇත. එමෙන්ම, 'පින්සර' යන යෙදුමට අරුත් දක්වමින්, 'පින්සර - පිනෙන් සරු වූ - පුන්‍යවන්ත' යනුවෙන් පැහැදිලි කර දී ඇත. වර්තමාන තරුණ පරපුර අතර පුළුල් භාෂා ඥානයක් ඇත්තවුන් විරල වීම සැබෑ තත්වයකි. ඇතැම් විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් ගැන බැලුවද මෙහි වෙනසක් නොමැති තරමිය. එපමණක් නොව, නූතන තරුණ පරපුර පැරණි සාහිත්‍ය පොතපත පරිහරණයෙන් ඈත් වෙමින් යන බව ද සැක නැතිවම කිව හැක්කකි. මේ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් දර්ශන රත්නායක මහතා හුදෙක් මහාචාර්යවරයකුගේ පණ්ඩිතමානී සිතුවිලිවලට කොටු නොවෙමින්, පාඨක පිරිස ගැන විශේෂ අවධානයකින් ද අනුකම්පාවකින් ද යුතුව, මෙම කෘතියෙහි පිටුවක් පිටුවක් පාසා පාදක සටහන් මගින් වචනවල අරුත් පැහැදිලි කර දීම වැදගත් සිතුවිල්ලක ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය යුතුය.

මෙම කාව්‍ය ග්‍රන්ථය පුරාම පැරණි බසට සමීපව යමින්, විශේෂයෙන්ම පැරණි කාව්‍ය භාෂාවට සමීප වෙමින් රචනා කිරීමට කවියා දරා ඇති ප්‍රයත්නය පැහැදිලිය. එසේ වුවද තම ස්වාධීනත්වයට හා අනන්‍යතාවට කිසිදු බාධාවක් නොවන සේ සුදුසු පරිදි, විරිත් විට උචිත පද හා යෙදුම් ගළපාගැනීමට මොනු සමත් වී ඇත.

"මියුලු නුවර දන කැල මුළුමුළුව
වනති සුවඳ දෙන නැණ තඹරිළුව
තිරිඳුගෙ විමසුම් ඇස යුහුසුලුව
විමසයි යළි දැල්වෙන ගිගිසිළුව"
(48 පිට, 100 පද්‍යය)

පෙර කී පරිදිම, පාඨකයාට එක්වර තේරුම් ගැනීමට අපහසු වදන්වලට, පාදක සටහන් මගින් අරුත් පළ කරමින් කතුවරයා මෙම පද්‍ය රචනා කර තිබෙන අයුරු තවදුරටත් පැහැදිලිය. බොහෝ විට අපට අසන්නට, කියවන්නට නොලැබෙන අන්දමේ වචනයක් ලෙස ගත හැකි, 'තඹරිළුව' යන්න පාඨකයාට එක්වරටම අර්ථය පැහැදිලි කරගත නොහැකි බැවි අවබෝධ කරගන්නා කතුවරයා, පාදක සටහන්වල එහි අරුත දක්වා ඇත්තේ, 'නෙළුම් වනය' යනුවෙනි. විශේෂයෙන්ම වර්තමාන පාඨකයාට පහසුවෙන් තේරුම් කරගන්නට අපහසු විය හැකි, 'මුළුමුළුව' යන වචනයට ද, 'එකට එක් වී' යනුවෙන් අරුත් දී ඇත. පැරණි බසට, පැරණි කවි බසට මෙන්ම පැරණි පද්‍ය සාහිත්‍යයට ද නුහුරු නුපුරුදු රසිකයන් මන්දෝත්සාහී නොවන ලෙස මෙලෙසින්, ඉමහත් පරිශ්‍රමයක් දරමින්, සුපරීක්ෂාකාරී ලෙස මෙම කාව්‍ය ග්‍රන්ථය රචනා කරන්නටත්, එය ප්‍රකාශයට පත් කරන්නට පෙර පාඨක ජනයා ගැන අවධානය යොමු කරමින් අරුත් දැක්වීමෙහි නිරත වන්නටත් කතුවරයා පියවර ගෙන තිබීම ප්‍රශංසනීයයි.

මෙම කාව්‍ය ග්‍රන්ථය පුරාම, ඒකාකාරි බවක් හෝ නීරස බවක් හෝ ඇති නොවන ලෙස අනුගමනය කොට ඇති පිළිවෙළ ද වැදගත්ය. කෘතිය පුරාම විවිධ විරිත් ආදිය යොදාගනිමින් රචනා වී ඇති අයුරු දැකගත හැකිය.

"මඳැටැ පෑ රතැඟිලි
මුවට ආ මඳ හසරැලි
රුවට රුව දිලි දිලි
මවට මෙන් දුනි ලොවට සැනසිලි"
(39 පද්‍යය)

"ළය පෙම් සුවඳ ජලේ
පිය මව් දෙදෙන ගිලේ
සිය කුල තඹර විලේ
සියපත් කඤුළ දිලේ"
(40 පද්‍යය)

"සත් ගුණමිණි මෙත් සයුරු
නෙත් පිනවන යුත් රුසිරු
සත් හැවිරිදි පුත් කුමරු
මිත් සෙනගට නෙත් අයුරු"
(41 පද්‍යය)

"වැසි වැස්සත් කෙළි මඩුලු තෙමෙන්ට
කිසි හිරිහැරයක් නැතද තමන්ට
මැසි විලි දැකැවුණු මිතුරු තුමන්ට
රිසි විය එහි කෙළි මැදුර තනන්ට"
(48 පද්‍යය)

"අමුත්තන් පුදන තැන නැගෙනහිර ඉදි වුණා
දිලින්දන් නිදන තැන බටහිරට ඉදි වුණා
බිරින්දන් වදන තැන දකුණු දෙස ඉදි වුණා
වෙළෙන්දන් රඳන තැන උතුරු පස ඉදි වුණා"
(52 පද්‍යය)

"අහසින් වැසිදිය පොළවැ එළා ලූ කලැ සී සාමියි එක් ගොවියෙක්
ගමකින් එක් ගොත් ගෙයක් මිලට ගෙන යන අතරේ
දැක අවසරයක්
ගොනුන් පැහැරගත් සොරු අල්වාගෙන දුන් සැටි
නිවැරදි තීරණයක්
දැක මගඹසු කැඳවමු, රජු කීවත් නුදුන්හ පඬිවරු
අනුබලයක්"
(58 පද්‍යය)

මේ අයුරින් 'නැණසිළුමිණ' කතුවරයා සිය කෘතිය පුරාම එකකට පසුව එකක් බැගින් විරිත් රාශියක් යොදාගනිමින් කවි රචනා කර ඇති ආකාරය අති විශේෂය. ඇතැම් පැරණි සිංහල කාව්‍ය ග්‍රන්ථ සමග සැසඳීමේදී මෙහි පෙනෙන එක් විශේෂ ලක්ෂණයක් නම් මෙම ලේඛකයා හැකි තරම් දුරට පාඨකයාට තේරුම් ගත හැකි වන පරිද්දෙන්, අතිශය දුෂ්කර යෙදුම් හෝ පද බැඳුම් යොදාගන්නට යොමු වී නොතිබීමයි. මහාෂධ පඬිතුමාගේ ජීවිත කාලය තුළ ඔහු දක්වන පුදුම සහගත දක්ෂතාවන් ද, අති විශේෂ ලෙස තම නැණ පමණින් විවිධ ප්‍රශ්න හා ගැටලු විසඳමින් සෙස්සන් මවිතයට පත් කරන ආකාරය ද, පාඨකයාට ඉතා පහසුවෙන් තේරුම් ගත හැකි වන පරිදි කවියට නගා තිබීම සැබවින්ම මෙම කාව්‍ය ග්‍රන්ථය නූතන පද්‍ය සාහිත්‍ය කෘති අතර කැපී පෙනෙන්නක් වීමට හේතු වෙයි.

'නැණසිළුමිණ නම් උමංදානන්දය' කෘතිය විශේෂ අවධානයකින් හා උනන්දුවකින් යුතුව කියවහොත් වර්තමාන තරුණ සාහිත්‍ය කරුවන්ට මෙන්ම විශ්වවිද්‍යාලවල අදාළ විෂයයන් හදාරන විද්‍යාර්ථීන්ට ද මෙමගින් අත් කරගත හැකි පල ප්‍රයෝජන ඉමහත්ය. කෘතියේ ආරම්භයේ සිටම කථා රසය ජනනය වන පරිද්දෙන් ද, පාඨක සිත් තුළ කුතුහලය සමග කිසියම් උත්තේජනයක් දනවන අයුරින් ද අනවශ්‍ය ලෙස දුෂ්කර බන්ධන ආදියෙන් ව්‍යාකූලත්වයට පත් නොකරවමින් ද අගනා කාව්‍ය ග්‍රන්ථයක් සේ රචිත මෙම නිර්මාණ කෘතිය මහාචාර්ය දර්ශන රත්නායක නම් කවියා අතින් බිහි වුණ විශිෂ්ට කාව්‍යයක් ලෙස හැඳින්විය හැකිය.

පොත පත දෙසට හෙලන විමසුම් ඇස

"සාහිත්‍ය සම්භාෂණ"

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන
ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන
"සාහිත්‍ය සම්භාෂණ"

එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන්

සෑම මසකම අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.
අන්තර්ජාලයෙන් www.sbs.com.au/yourlanguage/sinhalese/

IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents

Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com

We Deliver Results...